මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2017.04.27

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක -: 255/2017

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>අයවැය ප්‍රතිපාදන උපයෝගී කරගෙන බැඳීම් හා බැරකම් සඳහා එළඹීම</u>**

2017 වර්ෂයේ සිට වාර්ෂික විසර්ජන පනත මගින් සලසාදෙනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීම හා අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැඳීම් හා බැරකම්වලට එළඹීම වළක්වාලීමේ අරමුණ ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ඒ අනුව, වාර්ෂික විසර්ජන පනත මගින් එක් එක් වියදම් ශීර්ෂ වෙත අනුමත කරනු ලබන ප්‍රතිපාදන උපයෝගී කරගෙන වියදම් දැරීමේදී පහත දැක්වෙන පරිදි ක්‍රියාකළ යුතු ය.

(අ) පුද්ගලික පඩිනඩි හා දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා වාර්ෂික අයවැය සීමාව තුළ ප්‍රථමයෙන් බැඳීම් හඳුනාගත යුතු ය.

(ආ) එසේ හඳුනාගනු ලැබූ බැඳීම් පදනම් කරගෙන එම බැඳීම්වලට අදාළ භාණ්ඩ හෝ සේවා ලබාගත් පසු ඒ සඳහා ගෙවීමට ඇති මුදල් හා ගිවිසුම්වලට එළඹෙන ලද කොන්ත්‍රාත් සම්බන්ධයෙන් සහතික කළ වැඩවල වටිනාකම බැරකමක් ලෙස සටහන් කළ යුතු ය.

(ඇ) එක් මුදල් වර්ෂයකට වඩා වැඩි වර්ෂ ගණනක් සඳහා භාණ්ඩ, සේවා හා කොන්ත්‍රාත් පදනම් කරගෙන බැඳීම් සඳහා එළඹීමේදී හෝ බැඳීම් සඳහා එළඹුණු වර්ෂයේ එම බැඳීම් සඳහා වූ භාණ්ඩ හා සේවා ලැබී නොමැති හෝ කොන්ත්‍රාත් වැඩ ඉටුකර ඒ බවට සහතික කර නොමැති විටකදී එවැනි බැඳීම් ඉදිරි වර්ෂයට ගෙන යා හැක්කේ එම සම්පූර්ණ නොවූ බැඳීම් සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන එළඹෙන වර්ෂය සඳහා වෙන්කර දී ඇති විට පමණි.

(ඇ) ඒ අනුව, යම් මුදල් වර්ෂයකට අදාළ සියලුම බැරකම් එම වර්ෂය තුළදී මුදල් ගෙවා නිදහස් කළ යුතු අතර කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු ය. ඒ අනුව ඉහත උපදෙස්වලට පටහැනිව ඇති කරගනු ලබන වගකීම් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාරය තවදුරටත් කටයුතු කරනු නොලැබේ.

03. ඉහත බැඳීම්, බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි සිගාස් (CIGAS) ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කර ඇති බැවින් ඔබ විසින් ඉහත ගනුදෙනු සම්බන්ධ ක්‍රියාවලියේ සියලුම පියවරයන් සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

04. යම්කිසි නිශ්චිත දිනකට එක් එක් වියදම් ශීර්ෂ සඳහා වූ බැඳීම් හා බැරකම් ප්‍රමාණය හඳුනාගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහාම වෙන් වූ තොරතුරු පද්ධතියක් නඩත්තු කරන බැවින් එම තොරතුරු පද්ධතිය දිනපතා යාවත්කාලීන කිරීම සඳහා සෑම වියදම් ඒකකයක් විසින්ම දිනපතා තම බැඳීම් හා බැරකම් පිළිබඳ තොරතුරු www.newcigas.treasury.gov.lk වෙබ් අඩවියට උත්පනය (upload) කළ යුතු ය.

05. මෙම චක්‍රලේඛයේ කාර්යයන් සඳහා බැඳීම් හා බැරකම් පහත පරිදි නිර්වචනය කරනු ලැබේ. එනම්,

**බැඳීම් -** **භාණ්ඩ හා සේවා ලබාගැනීමේ අරමුණින් හෝ වැඩ කොන්ත්‍රාත් ඉටුකරවා ගැනීමේ අරමුණින් බාහිර පාර්ශ්වයන් සමඟ එළඹෙන ලද භාණ්ඩ, සේවා හා වැඩ සම්බන්ධ ගිවිසුම්/ඇණවුම්වල වටිනාකම**

**බැරකම් -** **විධිමත් පරිදි ලබාගන්නා ලද භාණ්ඩ හා සේවා සහ සම්පූර්ණ කර ඇති බවට සහතික කර ඇති කොන්ත්‍රාත් සඳහා තවදුරටත් ගෙවිය යුතු වටිනාකම**

06. මෙම චක්‍රලේඛයේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් තවදුරටත් අවශ්‍ය පැහැදිලිකිරීම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඒ.පී. කුරුම්බලපිටිය මහතා (දුරකථන අංක 0112484753) ඇමතීමෙන් ලබාගත හැකිය.

**ඒ.ආර්. දේශප්‍රිය**

**භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්**

පිටපත:

01. විගණකාධිපති